# ආහාර ස්වයංපෝෂිතභාවය සහ සුරක්ෂිතතාවය
## නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාකාරකම්

මානව වර්ගයාගේ ප්‍රමුඛතම මිනිස් උවමනාව ලෙස සලකනුයේ "ආහාර" ය. එම නිසා ම, බොහෝ සමාජ-ආර්ථික ක්‍රියාකාරකම්වල අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ ද තම ජන සමාජය සඳහා ප්‍රමාණවත් ආහාර නිෂ්පාදනයක් ඇති කරගැනීම ය. මන්ද., එසේ සිදු නො වන්නේ නම් එවැනි සමාජයක නො නැසී ජීවත් වීමත්, යහපත් පැවැත්මත් අපේක්ෂා කළ නො හැකි වන නිසා ය. මේ නිසා ම, "ආහාර ලබා ගැනීම" යන්න මූලික මානව අයිතියක් මෙන් ම මූලික මිනිස් අවශ්‍යතාවයක් ලෙස ලොව පිළිගෙන ඇත. එබැවින්, ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවය, ආහාර සුරක්ෂිතතාවය සහ ආහාර පිළිබඳ හිමිකම (ලබා ගැනීම සඳහා පවතින අයිතිය) වැනි සංකල්පමය ක්‍රියාකාරකම්, ශ්‍රී ලංකාවේ මෙන් ම බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධන සැලසුම් තුළ ක්‍රියාකාරී අරමුණු වී ඇත. "රටක ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවය" යන්නෙන් සරල ලෙස අදහස් වනුයේ, එම රටෙ හි ආහාර අවශ්‍යතාවයන් රට තුළ ම නිෂ්පාදනය කරගැනීම තුළින් අවශ්‍යතාවයන් සපුරා ගැනීම යි. "ආහාර සුරක්ෂිතතාවය" යන්නෙන් මෙහි දී අදහස් වනුයේ මානව සමාජයේ සෑම පුද්ගලයෙකුට ම "ආහාර ලබා ගැනීමේ" සමාන හැකියාවක් තිබිය යුතු බවත්, සෑම ගෘහ ඒකකයක් ම නිරන්තරයෙන් ආහාර නොමැති වීම හේතුවෙන් අනාරක්ෂිතභාවයට පත් වී දරිද්‍රතාවයට ගොදුරු නො විය යුතු බවත් ය. එමෙන් ම "ආහාර පිළිබඳ හිමිකම" යනුවෙන් අදහස් වනුයේ, ආහාර ලබා ගැනීමේ හිමිකමක් නැතහොත් නීතිමය අයිතියක් සමාජයේ සෑම පුද්ගලයෙකු ම සතු බව ය.

"පෙරදිග ධාන්‍යාගාරය" නමින් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාවේ ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවය සඳහා අනාදිමත් කාලයක ඉතිහාසයක් ඇත. අනුරාධපුර යුගයේ සිට මේ දක්වා මෙරට බිහි වී ඇති මහා වාරිමාර්ග ආශ්‍රිත ජන සමාජය හා ජනාවාස පද්ධතිය මේ පිළිබඳ ව මැනවින් සාක්ෂි දරනු ඇත. එතෙක් පැවති "ආහාර ස්වයංපෝෂිතභාවය" යටත් විජිත යුගයේ දී පරිහානියට පත් වූ අතර, ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවයට පත් වීමේ උත්සාහයක් නැවත දක්නට ලැබෙනුයේ 1948 දී මෙරට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගැනීමට වසර කිහිපයකට පෙර සිට ය. දේශීය ජන නායකයන්ගේ උත්සාහයෙන් 1935 දී ආරම්භ කළ ඉඩම් සංවර්ධන ආඥා පනතත්, ඒ අනුව පිහිටුවනු ලැබූ ගොවිජනපද ව්‍යාපාරත්, 1942 පමණ ආරම්භ කළ "ආහාර සහනාධාර" ක්‍රමයත් මෙහි ලා සුවිශේෂ සිද්ධීන් වනු ඇත. මේ අනුව ආහාරවලින් ස්වයංපෝෂිත වීමත්, ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිළිබඳවත් අනාදිමත් කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාව ලැබූ අත්දැකීම් සහිත දැනුම් සම්භාරය ලොව වෙනත් ජාතියක් හා සම කළ නො හැකි ය. එබැවින්, මෙම ලිපියේ මූලික අරමුණ වනුයේ නිදහසින් පසු ශ්‍රී ලංකාව ආහාර සම්බන්ධයෙන් ලබා ගත් ස්වයංපෝෂිතභාවය පිළිබඳවත්, ආහාර සුරක්ෂිතතාවය සඳහා අනුගමනය කළ විධිමත් ක්‍රියාමාර්ගයන් පිළිබඳවත්, වර්තමාන ලෝක ආහාර අර්බුදය හමුවේ මෙරට ජාතික දේශපාලන නායකයන් ඒ සඳහා විසඳුම් ලබා දුන් ආකාරයත් පිළිබඳ ව විමර්ශනාත්මක කෙටි අධ්‍යයනයක යෙදීම ය.

### නිෂ්පාදනය හා කෘෂිකාර්මික සංවර්ධනය

ජනතාවගේ "දරිද්‍රතාවය" තුරන් කරලීමෙ හි ලා ශ්‍රී ලංකාව ලබා ඇති ජයග්‍රහණයන් සුවිශාල ය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සකස් කරන ලද මානව සංවර්ධන දර්ශකය, ජීවන අපේක්ෂාව, වැඩිහිටි සාක්ෂරතා අනුපාතය හා ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය වැනි දර්ශකයන් මගින් මේ බව මැනවින් පැහැදිලි වේ. ශ්‍රී ලංකාව, දකුණු ආසියානු හා ඇතැම් සංවර්ධනය වෙමින් පවතින අප්‍රිකානු රටවල මෙම දර්ශකයන්ගේ තුලනාත්මක සංවර්ධනය පහත වගුව මගින් නිරූපයන වේ.

වගුව 1 අනුව, ශ්‍රී ලංකාව මානව සංවර්ධන ක්ෂේත්‍රයේ ලබා ඇති ප්‍රගතිය ඉමහත් ය. මේ සඳහා දායක වූ ප්‍රධාන හේතුවක් ලෙස ආහාර නිෂ්පාදන අංශයේ සිදු වූ වර්ධනය හා සංවර්ධනය පෙන්වා දිය හැකි ය. නිදහසින් පසුව මෙරට ඇති වූ කෘෂිකාර්මික සංවර්ධන පෙරළිය මෙහි ලා බලපාන ලද මූලික සාධකයකි.

වගුව 1

**දකුණු ආසියානු සහ අප්‍රිකානු රටවල් කිහිපයක සංවර්ධන දර්ශක**

| රට | ප්‍රමුඛතා අංකය | මානව සංවර්ධන දර්ශකය | ජීවිත අපේක්ෂාව (වසර) | වැඩිහිටි සාක්ෂරතාවය (%) | ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය (එක්සත් ජනපද ඩොලර්-2007) |
|---|---|---|---|---|---|
| **ලෝකය** | - | **0.74** | **68.1** | **78.6** | **7,995** |
| ශ්‍රී ලංකාව | 99 | 0.743 | 71.6 | 90.7 | 1,540 |
| මාලදිවයින | 100 | 0.741 | 67.0 | 96.3 | 3,190 |
| ඉන්දියාව | 128 | 0.619 | 63.7 | 61.0 | 950 |
| පකිස්ථානය | 136 | 0.551 | 64.6 | 49.9 | 860 |
| බංගලිදේශය | 140 | 0.547 | 61.3 | 47.5 | 470 |
| නේපාලය | 142 | 0.534 | 62.6 | 48.6 | 350 |
| සැම්බියාව | 165 | 0.434 | 40.5 | 68.0 | 770 |
| සියරාලියොන් | 177 | 0.336 | 41.8 | 34.8 | 260 |

මූලාශ්‍රය : මානව සංවර්ධන වාර්තාව (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන) 2007/2008 සහ ලෝක සංවර්ධන දර්ශක 2009

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ රටවල් කෘෂිකාර්මික සංවර්ධනය තුළින් තම රටෙ හි ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලසුම් සකස් කරගත් රටවල් විය. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලයට පත් සෑම ආණ්ඩුවක් ම ආහාර නිෂ්පාදනයේ වර්ධනය හා සංවර්ධනය තුළින් කෘෂිකාර්මික සංවර්ධනයක් අපේක්ෂා කළ අතර, එමගින් දුරිද්‍රතාවය තුරන් කිරීමටත්, ආර්ථික සංවර්ධන අරමුණු කරා ළඟාවීමටත් උත්සාහ කරනු ලැබී ය. නිදහසින් පසු ගෙවිගිය 60 වසරක කාලය තුළ මෙම මූලික අරමුණෙ හි සැලකිය යුතු වෙනසක් ඇති නො වුව ද, බලයට පත් විවිධ ආණ්ඩු ඒ සඳහා විවිධ වූ ක්‍රියාමාර්ග ගත්හ. කෙසේ වුව ද, ආහාර නිෂ්පාදනය වැඩිකර කෘෂිකාර්මික සංවර්ධනය තුළින් ග්‍රාමීය දුරිද්‍රතාවය තුරන් කළ යුතු ය යන මූලික යාන්ත්‍රණයෙ හි සැලකිය යුතු ප්‍රගතියක් ඇති වුවා මිස එහි මූලික වෙනසක් ඇති නො විය. පසුකාලීන ව, විශේෂයෙන් ම 1970 ගණන්වල දී ආරම්භ කළ මහවැලි සංවර්ධන ව්‍යාපාරය සහ වෙනත් මහා පරිමාණ කෘෂිකාර්මික සංවර්ධන යෝජනා ක්‍රම මේ සඳහා මැනවින් දායක විය. සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාවේ ද ආර්ථිකය තුළ කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය ඉතා වැදගත් වන අතර, එය සම්පූර්ණයෙන් ම ග්‍රාමීය අංශය තුළ ක්‍රියාත්මක වන්නක් වී ඇත. ග්‍රාමීය ජනතාවගේ ආදායම් හා ආහාර ලබාගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය කෘෂි අංශය වී ඇත. කෘෂිකාර්මික සංවර්ධනය තුළ ඉඩම් නොමැති ග්‍රාමීය පවුල් සඳහා රැකියා වැඩි කරන අතර, ආර්ථිකයේ අනෙක් අංශ සඳහා අඩු මිලට

වගුව 2

**ජනගහනයේ දරිද්‍රතා ප්‍රතිශතය සහ ආහාර සලාකය ලබාදිය හැකි ජනගහනය, 1948-1970**

| වසර | ආහාර සලාක ලබාදිය හැකි පුද්ගල ප්‍රමාණය | මුළු ජනගහනය | දරිද්‍රතා ප්‍රතිශතය % |
|---|---|---|---|
| 1948 | 6,339,000 | 7,109,000 | 89.17 |
| 1951 | 6,780,000 | 7,742,000 | 87.57 |
| 1955 | 6,140,000 | 8,550,000 | 71.81 |
| 1960 | 8,522,069 | 10,063,000 | 84.68 |
| 1970 | 11,612,763 | 12,514,000 | 92.79 |

මූලාශ්‍රය: පරිපාලන වාර්තාව, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව 1951-1970

ආහාර සපයනුයේ කෘෂි අංශය යි. කෘෂි අංශයේ වර්ධනය තුළින් නිරන්තරයෙන් ඇතිවන ආහාර නිෂ්පාදනයේ වැඩි වීම මගින් ග්‍රාමීය ගොවීන්ගේ නිෂ්පාදන හා ආදායම් උපදවීමේ ක්‍රියාවලියෙ හි පවතින "අවදානම" අඩු කරන අතර, ඒ තුළින් ම ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය වර්ධනය වී ගොවි ජනතාවගේ ජීවිතය යහපත් වනු ඇත. දේශිය ආහාර නිෂ්පාදනයේ ස්වයංපෝෂිත මට්ටමත්, ආර්ථික සුරක්ෂිතතාවයක් මෙරට කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලිය තුළ නිරන්තරයෙන් ම දක්නට විය. එබැවින් ගෙවී ගිය 60 වසරකට ආසන්න කාලය තුළ මෙරට ග්‍රාමීය දරිද්‍රතාවය ඉතා සීඝ්‍රයෙන් අඩු වී ඇති අතර, ආහාර ස්වයංපෝෂිතභාවයත්, සුරක්ෂිතතාවයත් දකුණු ආසියාවේ වෙනත් බොහෝ රටවලට වඩා වර්ධනය වී ඇත. එය ශ්‍රී ලංකාව ලැබූ අතිවිශිෂ්ට ආර්ථික ජයග්‍රහණයක් මෙන් ම, මෙරට ඇති වෙමින් පවත්නා සමාජ-ආර්ථික විපර්යාසය සඳහා දැමූ මූලික අඩිතාලමක් ද විය.

## රටක ආහාර ස්වයංපෝෂිතභාවය සහ සුරක්ෂිතභාවය පිළිබඳ අරමුණු එකිනෙකට වෙනස් වේ ද?

ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවය යනුවෙන් සරල ලෙස අදහස් වනුයේ, කිසියම් රටක ආහාර අවශ්‍යතාවය දේශිය ආහාර නිෂ්පාදනයෙන් ම සපුරා ගන්නා බව ය. මෙයින් ගම්‍ය වන අනෙක් අදහස නම්, කිසියම් රටක ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා අනුගමනය කළ හැකි හොඳ ම මාර්ගය වනුයේ ඒ රටෙහි ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවයේ මට්ටම ඉහළ නැංවීම යන්න යි. එබැවින්, ආහාර ස්වයංපෝෂිත බව සහ ආහාර සුරක්ෂිතතාවය අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින්නකි. රටක් ආහාර ලබා ගැනීමේ දී ජාත්‍යන්තර වෙළෙඳපොළ මත රඳා පවතින්නේ නම්, එවැනි රටක් තම ආහාර සැපයුමේ පාලනයක් ඇති කර ගත යුතු ව ඇත. එසේ වුව ද, රටක් "ජාත්‍යන්තර වෙළෙඳපොළට" විවෘත විය යුතු බවට පිළිගත් මතයක් ද මෙම ක්ෂේත්‍රය තුළ දක්නට ඇත.

ආහාර සුරක්ෂිතතාවය හා ආහාර ස්වයංපෝෂිතභාවය යන සංකල්පයන් දෙක ම ප්‍රමාණාත්මකව මනිනු ලබන අතර, ස්වයංපෝෂිතභාවය යනු භාවිතා කරන ලද, නැතහොත් පරිභෝජනය කරන ලද ආහාර ප්‍රමාණය, දේශිය ආහාර නිෂ්පාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දක්වා සිටීම යි.

එබැවින්, බොහෝ ආසියා අප්‍රිකා රටවල ආහාර නිෂ්පාදනය පිළිබඳ සැලැසුම් හි ප්‍රධාන දර්ශකයක් ලෙස "ආහාර ස්වයංපෝෂිතභාවය පිළිබඳ අනුපාතය" පිළිගෙන ඇත. මේ අතර, රටක පවත්නා ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවයත්, සුරක්ෂිතතාවයත් අතර මූලික වෙනස්කම් දෙකක් හඳුනා ගත හැකි ය.

i. ආහාර ස්වයංපෝෂිතභාවය යන්නේ දී, සම්පූර්ණයෙන් ම දේශිය ආහාර නිෂ්පාදන සැපයුම් මූලාශ්‍රයන් පමණක් සලකා බැලෙන අතර, "ආහාර සුරක්ෂිතතාවය" යන්නේ දී, වාණිජ වශයෙන් ආහාර ආනයනය කිරීමත්, ආහාර ආධාරත් ආහාර සැපයුම් මූලාශ්‍රයන් ලෙස සලකා බැලෙනු ඇත.
ii. ආහාර ස්වයංපෝෂිතභාවය මගින් ජාතික මට්ටමේ දී ලබා ගත හැකි දේශිය ව නිෂ්පාදනය කරන ආහාර කෙරෙ පමණක් අවධානය යොමු කරනු ලබන අතර, "ආහාර සුරක්ෂිතතාවය" මගින් ආහාර සැපයුම් මාර්ගයන් හි පැවතිය යුතු ස්ථාවර බවත්, සියලු ජනගහනය වෙත ආහාර ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමේ හැකියාවත් සලකා බලනු ඇත.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ආහාර නිෂ්පාදන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සියල්ල ම පාහේ "ආහාර ස්වයංපෝෂිතභාවය" මෙන් ම "ආහාර සුරක්ෂිතතාවය" පිළිබඳ දැඩි ව සැලකිල්ලට භාජනය කර ඇත. 1970-1977 කාලය තුළ පූර්ණ වශයෙන් ම දේශිය නිෂ්පාදනය මගින් ආහාර අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ උපාය මාර්ග අනුගමනය කළ අතර, 1977 න් පසු ව මෙරට ඇති කරන ලද නව ආර්ථික ප්‍රතිසංස්කරණවලින් පසුව, වැඩි අවශ්‍යතාවයක් ආනයන මගින් සපුරා ගැනීමේ ප්‍රතිපත්තීන් ද ක්‍රියාත්මක විය. මෙම තත්ත්වය දේශිය ආහාර නිෂ්පාදන අංශයේ වර්ධනයට මෙන් ම සංවර්ධනයට දැඩි සේ බාධාකාරී විය. අනෙක් අතට ආහාර සුරක්ෂිතතාවයේ යම් වර්ධනයක් පෙන්නුම් කළ ද එය රටෙ හි "ආහාර ස්වයංපෝෂිතභාවය" පිළිබඳ ගැටළු සමූහයක් ඇති කරන්නක් විය.

වසර 2005 දී ආරම්භ කරන ලද "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ දේශිය ආහාර නිෂ්පාදනය ස්වයංපෝෂිත මට්ටම කරා ළඟා වීම කෙරෙ අවධානය යොමු කර ඇත. මේ අනුව, මෙරට කෘෂිකාර්මික අංශය සඳහා හඳුන්වා දුන් "අපි වවමු- රට නගමු" වැඩසටහන යටතේ "ආහාරවලින් රට ස්වයංපෝෂිත මට්ටම" කරා ළඟා වීමටත්, ඉදිරි වසරවල දී ආනයනය

කරන ආහාර ප්‍රමාණයන් සීමා කර, නවතාලීමටත් තීරණය කර ඇත. මෙය සත්‍ය වශයෙන් ම මෙරට කෘෂිකාර්මික සංවර්ධනය සඳහාත්, රටෙ හි ආහාර ස්වයංපෝෂිතභාවය වර්ධනය කිරීමටත්, විදේශීය ආහාර වෙළෙඳපොළ කෙරෙහි රඳා පැවත්ම තවදුරටත් අඩු කිරීමටත්, දේශීය වශයෙන් මෙරට ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීමටත් හේතු වනු ඇත.

**නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය සම්බන්ධ ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් :1948-2008**

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය සඳහා හඳුන්වා දුන් විශේෂිත ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් පිළිබඳ නිශ්චිත සංඛ්‍යාත්මක අගයක් හඳුනා ගත නො හැකි අතර, ඒ සඳහා හඳුන්වා දුන් වැඩසටහන් ප්‍රමාණය අති විශාල ය. විවිධ ආණ්ඩු පාලන කාලයන් හි විවිධ වැඩසටහන් හඳුන්වා දී ඇති අතර, මේ සියල්ලගේ ම පොදු පරමාර්ථයන් වුයේ ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කරමින්, සංවර්ධනය කිරීම ය. මෙම විශේෂිත ප්‍රතිපත්තිමය වැඩසටහන් තුළින් බලාපොරොත්තු වූ ප්‍රධාන මෙන් ම අවසන් අරමුණු වුයේ ශ්‍රී ලංකාවේ ආහාර “නිෂ්පාදනය වැඩි” කරමින් ස්වයංපෝෂිතභාවය කරා ළඟා වෙමින්, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරලීම ය. අධ්‍යයන පහසුව සඳහා මෙම වැඩසටහන් ප්‍රධාන අවධි දෙකකට බෙදා වෙන් කළ හැකි ය. එනම්, 1948-1977 අතර කාලය පළමු අවධිය ලෙසත්, 1977 සිට 2008 දක්වා පවත්නා අවධිය දෙවන අවධිය ලෙසත් ය. මෙම අවධීන් දෙක තුළ දී හඳුන්වා දුන් විශේෂිත ප්‍රතිපත්තිමය වැඩසටහන් සංක්ෂිප්ත ලෙස පහත සඳහන් පරිදි හඳුනා ගත හැකි ය. (වගුව 3)

වගුව 3

| 1948-1977 පළමු අවධිය | 1977 සිට 2000 දක්වා අවධිය |
|---|---|
| • 1931,1948 - නව කෘෂිකාර්මික හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපාර සහ ඉඩම් සංවර්ධන ව්‍යාපාර | • 1977 - නව ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම යටතේ ආනයන - අපනයන වෙළෙඳාම සහ විදේශ ආයෝජන දිරිමත් කරමින් විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම |
| • 1958 - කෘෂිකාර්මික සැලැස්ම, කුඹුරු ඉඩම් පනත, සමුපකාර ප්‍රතිසංවිධාන හා වගා කමිටු පිහිටුවීම. | • 1978 - කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාර වැඩසටහන ආරම්භ කිරීම. |
| • 1960 - ගණන් වල දී හඳුන්වා දුන් “හරිත විප්ලවය” පිළිබඳ වැඩසටහන : වැඩි දියුණු කරන ලද නව බීජ වර්ග සහ නව යෙදවුම් හඳුන්වා දීම මඟින් ආහාර නිෂ්පාදනය වැඩි කිරීම. | • 1978 - වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය සහ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම. |
| • 1963 – කඩිනම් ආහාර වගා කිරීමේ වැඩසටහන සමග 1965-1970 කෘෂිකාර්මික සංවර්ධන යෝජනා | • 1982/84 - ගල්ඔය වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය යටතේ පළමුවරට ගොවි සංවිධාන පිහිටුවීම. |
| • 1965 – කඩිනම් ආහාර වගාකිරීමේ වැඩසටහන සමග 1965-1970 කෘෂිකාර්මික සංවර්ධන යෝජනා | • 1986 - සහභාගීත්ව ජල කළමනාකරණ වැඩසටහන් හඳුන්වා දීම. |
| • 1971 - පස් අවුරුදු සැලැසුම් වැඩසටහන යටතේ කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම. | • 1995 - නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති රාමුවක් සකස් කර, ක්‍රියාත්මක කිරීම. |
| • 1970 – දේශීය ආහාර නිෂ්පාදන දිරිමත් කිරීමත්, ඒ සඳහා සංවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම | • 1995-අමා වැඩසටහන : ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයක් ලෙස සන්නිවේදන ක්‍රියාවලිය |

| | |
|---|---|
| • 1971-1972 ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩසටහන සහ එළදා වර්ධන නීතිය | • 1996 වගා ලංකා වගා සංග්‍රාමය හඳුන්වා දීම මගින් ආහාර නිෂ්පාදනය වැඩි කිරීම. |
| • 1971 – මහවැලි සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීම. | • 1997 - යාය ආදර්ශ වැඩසහන් හඳුන්වා දීම මගින් වී අස්වනු වර්ධනය කිරීම. |
| • 1972 – සාමූහික ජනාවාස හා ගොවිපොළ ක්‍රම හඳුන්වා දීම, ක්‍රියාත්මක කිරීම. | • 1997 - ප්‍රධාන භෝග සඳහා විශේෂ කාර්ය සාධන කණ්ඩායම් පිහිටුවීම. |
| • 1972 - කෘෂි නිෂ්පාදිත ආශ්‍රිත ප්‍රාදේශිය සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම. | • 1998 - ඉඩම් හිමිකම් පිළිබඳව ස්වර්ණභූමි හා ජයභූමි ඔප්පු ප්‍රදානය |
| • 1972 – වී අලෙවි මණ්ඩලය මගින් වී මිල දී ගැනීමේ වැඩසටහන් විධිමත් කිරීම. | • 1999 - ගොවි සමාගම් හඳුන්වා දීම හා පිහිටුවීම. |
| • 1972 - කෘෂිකාර්මික ණය හා යෙදවුම්, විවිධ සේවා සමුපකාර සමිති මගින් ලබාදීමේ වැඩසටහන් දියත් කිරීම. | • 2000 - නව කෘෂිකර්මය පිළිබඳ පර්යේෂණ ප්‍රතිපත්ති ක්‍රියාවලියක් හඳුන්වා දීම. |

ශ්‍රී ලංකාවේ "කෘෂිකාර්මික සංවර්ධනය" තුළ ඉතා වැදගත් කාලපරිච්ඡේදයක් වාර්තා වන්නේ වසර 2000 න් පසුව ය. එය ගත වූ වසර 8 ක කාලය තුළ හඳුන්වා දුන් හා ක්‍රියාත්මක වූ කෘෂිකාර්මික වැඩසටහන් මගින් මනාව පැහැදිලි වනු ඇත. කෙසේ වුව ද, 2001 වසර ආරම්භයේ දී මෙරට ආර්ථිකයේ සෘණ වර්ධන වේගයක් වාර්තා කළ අතර 2005 වර්ෂයේ දී "මහින්ද චින්තනය" පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් මෙරට "කෘෂිකාර්මික හා ආහාර නිෂ්පාදන" ක්‍රියාදායමයෙ හි නව වැඩසටහන් රැසක් හඳුන්වා දුන් අතර ඒවා මෙරට සමාජ ආර්ථික සංවර්ධනයෙ හි ලා මහඟු මෙහෙවරක් ඉටු කරනු ඇත.

**වසර 2001-2008 කාලය තුළ ආහාර නිෂ්පාදනය සඳහා දායක වූ වැඩසටහන්**

2001 - ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘති වැඩසටහන් හඳුන්වා දීම (දකුණු පළාත)

2002 - යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන

2004 - කුඩා වැව් දස දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන

**2005-2008 මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය හඳුන්වා දීම නිසා වූ ප්‍රධාන ක්‍රියාත්මක වැඩසටහන් කීපයක්**

- ❖ මොරගහකන්ද වාරිමාර්ග ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- ❖ රඹකැන් ඔය වාරිමාර්ග ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- ❖ වෙහෙරගල වාරිමාර්ග ජල යෝජනා ක්‍රමය සමඟ වෙනත් කුඩා පරිමාණ වාරි සංවර්ධන යෝජනා
- ❖ පොහොර සහනාධාර වැඩසටහන හඳුන්වා දීම
- ❖ ආහාර සහ අපනයන කෘෂිකර්ම භෝග සහ විසිතුරු පැළෑටි පිළිබඳ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති හඳුන්වාදීම.
- ❖ කෘෂි ද්‍රව්‍ය මිල දී ගැනීමේ අධිකාරිය පිහිටුවා වී මිලදී ගැනීමේ නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ "අපි වවමු - රට නගමු" වැඩසටහන හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම : දේශිය ආහාර දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම
- ❖ නැගෙනහිර නවෝදය වැඩසටහන් – අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක සඳහා ක්‍රියාත්මක කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන
- ❖ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ ජාතික වැඩපිළිවෙළ
- ❖ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන
- ❖ කාබනික පොහොර භාවිතා කිරීමේ වැඩසටහන් හඳුන්වා දීම.
- ❖ "ගම නැගුම" සහ "මග නැගුම" වැඩසටහන්

ශ්‍රී ලංකාවේ ආහාර පිළිබඳ ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවීම සහ ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීමෙ හි ලා මෑතකාලීන ව ප්‍රධාන ම බාධකයක් වූයේ මෙරටට හඳුන්වා දුන් "විවෘත ආර්ථික ප්‍රතිපත්ති" යයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙරට බහුල ලෙස වගා කරන ලද ඇතැම් භෝග නිෂ්පාදනයන් අඩු වී ගිය අතර, අඩු මිලට ආනයනික ආහාර ද්‍රව්‍ය වෙළෙඳපොළ තුළ සුලභ විය. "ආහාර සුරක්ෂිතභාවය" යන්න මෙහි දී යම් ප්‍රමාණයකින් වර්ධනය වූ අතර, "ආහාර ස්වයංපෝෂිභාවය" පිළිබඳ විවිධ ගැටළු ඇති විය. උදාහරණයක් ලෙස, මෙරට "වියළි මිරිස් නිෂ්පාදනය" සම්පූර්ණයෙන් ම පාහේ අඩු වී ඇති අතර, මුළු අවශ්‍යතාවය ම ආනයනය කෙරේ. එසේ ම අර්තාපල් ලොකුළූණු මුං ඇට වැනි භෝග අවශ්‍යතාවයන් දේශීය නිෂ්පාදනවලින් ද, ආනයන වලින්ද සපුරාලනු ඇත. මේ නිසා, මෙම ආහාර ද්‍රව්‍යවලින් "දේශීය ආහාර ස්වයංපෝෂිතභාවය" ඉහළ නැංවීමේ ගැටළුවක් ඇති වුවා මෙන් ම විශාල විදේශ විනිමයක් වැය වීම ද මෙරට ආර්ථිකය කෙරෙහි දැඩි බලපෑම් ඇති කරන්නක් විය. මෙයට අමතර ව ආහාර ස්වයංපෝෂිතභාවයට හා සුරක්ෂිතතාවයට බලපාන ලද තවත් හේතූන් රැසක් විය. වර්ෂ 1948 සිට මේ දක්වා රට තුළ සිදු වූ "ප්‍රතිපත්තිමය දේශපාලන වෙනස්වීම්" එවැනි එක් හේතුවක් වෙද්දී, පසුගිය තිස් වසරක කාලයක් තුළ බලපෑ "එල්ටීටීඊ ත්‍රස්තවාදය" ද ප්‍රබල ම හේතුවක් විය. විශේෂයෙන් ම මෙරට දේශීය කෘෂිකර්මයේ හදවත බඳු වියළි කලාපයේ ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශවල එම කටයුතු අඩපණ වීමෙන් ස්වයංපෝෂිතභාවය පිළිබඳ බාධාවන් ඇති විය. මඩකලපුව, ත්‍රිකුණාමලය, යාපනය, අම්පාර, මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික කටයුතුවල අඩපණ වීම හේතුවෙන් "ජාතික ආහාර නිෂ්පාදන" ක්‍රියාවලිය ද අඩපණ වී ගිය අතර, මෑතකාලීන ව නැගෙනහිර පළාතේ ඇතැම් සංවර්ධන කටයුතු හේතු කොට ගෙන ඉදිරි කාලයේ දී මෙරට ආහාර ස්වයංපෝෂිතභාවය මෙන් ම සුරක්ෂිතතාවය වර්ධනය වනු ඇත.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම රාජ්‍ය ප්‍රතිපත්තිමය වැඩසටහන්වල ප්‍රමුඛතාවය කොට ගත් බව පෙනේ. ඒ සෑම වැඩසටහනක් තුළ ම පොදුවේ පහත සඳහන් ක්‍රියාකාරකම් දක්නට හැකි විය.

- නව හා වැඩි දියුණු කළ වාරිමාර්ග යෝජනා ක්‍රම මගින් වාරිමාර්ග පහසුකම් සලසා වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම, නව වගා බිම් ඇති කිරීම.
- ආහාර නිෂ්පාදනය ඇතුළු කෘෂි ක්ෂේත්‍රයේ පර්යේෂණ, සංවර්ධන හා ව්‍යාප්ති සේවා වැඩි දියුණු කිරීම.
- සහනාධාර ක්‍රම යටතේ කෘෂිකාර්මික යෙදවුම් ලබාදීම, පොහොර සහ කෘෂිකාර්මික ණය ක්‍රමයන් වඩාත් ප්‍රමුඛතාවයට පත්කර ක්‍රියාත්මක කිරීම.
- කෘෂි භාණ්ඩ වෙළෙඳපොළ ආශ්‍රිත ආයතනික හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, නව මිල ප්‍රතිපත්ති හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම.
- ආනයනික ආහාර ද්‍රව්‍ය සීමා කිරීම මගින් දේශීය ආහාර ද්‍රව්‍යවල නිෂ්පාදනය හා පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.

පොදුවේ සලකා බලන කල ඉහත වැඩසටහන් හා ප්‍රතිපත්ති මගින් විශේෂ ප්‍රගතියක් පෙන්නුම් කළ ද ඇතැම් අවස්ථාවන් හි ඒවා තාවකාලික බවක් හෝ ගැටළු සහගත බවක් දැක්වූයේ විවිධ බාධාවන් හේතු කොටගෙන ය. ප්‍රතිපත්තිම ය ගැටළු, දේශපාලන දුර්වලතා, ප්‍රමාණවත් මුල්‍ය හා භෞතික හා සමාජීය ගැටළු ද ඒ අතර ප්‍රධාන වේ. කෙසේ වුවත්, පසුගිය වසර 60 ක පමණ කාලය ලොව අන් රටවල් හා සසඳා බැලීමේ දී, ආහාර ස්වයංපෝෂිතභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ යම් යම් ගැටළු සහගත තත්ත්වයන් ඇති වුව ද, බොහෝ රටවල මෙන් ප්‍රමාණවත් ආහාර නොමැතිව හටගත් දුර්භික්ෂයන්ට ගොදුරු නො වීමටත්, ආහාර අනාරක්ෂිතභාවය හේතු කොට ගත් පීඩාවන්ට ගොදුරු නො වීමටත්, තරම් ශ්‍රී ලාංකිකයෝ වාසනාවන්තයෝ වූහ.

## ආහාර නිෂ්පාදනය සඳහා රාජ්‍ය මැදිහත්වීම් හා දායකත්වය

"ආහාර නිෂ්පාදනය" සංවර්ධනය කිරීමෙ හි ලා වැඩි ම රාජ්‍ය මැදිහත්වීමක් සමග දායකත්වයක් ලබා දුන් රටක් ලෙස ශ්‍රී ලංකාව, ලොව වෙනත් රටවල් සමග සන්සන්දනය කළ නො හැකි ය. ආහාර නිෂ්පාදනය සඳහා රාජ්‍ය දායකත්වය, මෙරට ඉතිහාසය පුරා ම සෑම ආණ්ඩු පාලන සමයක ම දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් විය. වර්ෂ 1948 පසුව පැවති සෑම මැතිවරණයක දී ම සහ එම මැතිවරණ ප්‍රකාශනයන් තුළ ම සඳහන් වූයේ, ශ්‍රී ලංකාව ආහාර නිෂ්පාදනය

අතින් ස්වයංපෝෂිත මට්ටම කරා ළඟා කරවන බව ය. එමෙන් ම මෙරට ඇති වූ දේශපාලනය වෙනස්වීම් නැතහොත්, පැවති ආණ්ඩු "වෙනස්වීම්" වලට බලපාන ලද මූලික හේතුව වූයේ ද කලින් කලට උද්ගත වූ "ආහාර" පිළිබඳ විවිධ ගැටළු ය. මේවා අතර, ආහාරවල මිල ගණන් ඉහළ යාම, ආහාර සහනාධාර කපා හැරීම හෝ අඩු කිරීම, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල හිඟකමක් පැවතීම, ආහාර ආනයන තහනම් කිරීම් හෝ බදු අනුපාත වෙනස් කිරීම් ආදිය ද හේතු විය.

ආහාර ස්වයංපෝෂිතභාවය හා සුරක්ෂිතතාවය සඳහා රාජ්‍ය මැදිහත්වීම සහ එහි විධික්‍රමයන්ද මෙහිදී සලකා බැලිය යුතු ය. පහත සඳහන් ක්‍රියාකාරකම් මෙහි ලා ප්‍රධාන වනු ඇත.

- ආහාර සහනාධාර ක්‍රම හඳුන්වා දීම, පැවති සහනාධාර ක්‍රමය සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම (සහල් සහනාධාර ඉවත්කර, ආහාර මුද්දර ක්‍රමය හඳුන්වා දී පසුව එය වෙනත් ආහාර සහනාධාර ක්‍රමයන් බවට පරිවර්තනය කිරීම).
- ආහාර නිෂ්පාදනය පිළිබඳ නව වැඩසටහන් හඳුන්වා දීම (වගා සංග්‍රාමය, වගා ලංකා වගා සංග්‍රාමය සහ අමා වැඩසටහන)
- ආහාර නිෂ්පාදනය ආශ්‍රිත නව කෘෂිකාර්මික ප්‍රතිපත්තීන් හඳුන්වා දීම (රසායනික පොහොර සහනාධාර සහ කෘෂි ණය පිළිබඳ වැඩසටහන් දියත් කිරීම).
- ආහාර නිෂ්පාදනය ආශ්‍රිත ව පවතින ආයතන පද්ධතීන් හි නිතිමය සංශෝධන ඇති කිරීම් සහ නව ආයතනික ව්‍යුහයන් ඇති කිරීම (වී අලෙවි මණ්ඩලය පිහිටුවීම හා වසා දැමීම, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, කෘෂි ද්‍රව්‍ය මිල දී ගැනීමේ අධිකාරිය පිහිටුවීම).
- විදේශයන්ගෙන් විශාල ආහාර තොග ආනයනය කිරීම, අර්තාපල්, ලොකුළූණු, මිරිස් ආදියෙහි ආනයන ඉහළ යාම හා දේශීය නිෂ්පාදනය කඩා වැටීම.
- ශ්‍රී ලංකාව සඳහා ආහාර ආධාර වෙනත් රටවලින් හා ජාත්‍යන්තර ආයතනවලින් ලබාගැනීම (ලබාගන්නා ආහාර ආධාර ප්‍රමාණය ඉහළ යාම).
- වී මිල දී ගැනීමේ ගැටළුව හා ආහාර මිල ගණන් දිගින් දිගට ම ඉහළ යාම).

ඉහතින් දක්වන ලද සියළු ක්‍රියාකාරකම් මෙරට ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ ස්වයංපෝෂිතභාවයට හා සුරක්ෂිතතාවයට සෘජු ව බලපෑම් කරනු ලබන ඒවා ය. පසුගිය දශක දෙකක පමණ කාලය තුළ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ මහත් සංවාදශීලී මෙන් ම විවාදශීලී සාකච්ඡාවන්ට භාජනය වූ ඉහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා මෙතෙක් ප්‍රමාණවත් විසඳුම් ලබාගෙන නැත. මේ නිසා 2000 න් පසු ව පත් වූ ආණ්ඩුවලට අභියෝගාත්මකව මෙම ගැටළු සඳහා මුහුණ දීමට සිදු විය. ඕනෑ ම රටක ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ හෝ ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ හෝ වේවා එහි සාර්ථකත්වය මූලික වශයෙන් රඳා පවතින්නෙ එම රටෙහි පවතින "දේශපාලන ස්ථාවරතාවයත්", "දේශපාලන දර්ශනයේ තිරසාරභාවයත්" හේතු කොටගෙන ය. එබැවින්, මෙරට ආහාර ස්වයංපෝෂිතභාවය මෙන් ම සුරක්ෂිතතාවයේ ප්‍රමාණය පිළිබඳ ප්‍රමාණවත් වර්ධනයක් හා සංවර්ධනයක් ලබා දීමට සමත් නොවී ඇත. සෑම ආණ්ඩුවක් ම ආහාර නිෂ්පාදනය සම්බන්ධයෙන් මුහුණ පෑ ප්‍රබල ගැටළුවක් විය. එය නම්, අස්ථාවර දේශපාලන තීරණයන් සහ විවිධ පාලන වකවානුවල දී අදාළ ආහාර නිෂ්පාදන ප්‍රතිපත්ති හා වැඩසටහන්වල සිදුවන වෙනස් වීම යි. එම නිසා ඇති වූ බාධාකාරී තත්ත්වයන් මෙහි ලා සඳහන් කළ යුතු ය.

ආහාර ස්වයංපෝෂිතභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ ව නිදහසින් පසු බලයට පත් වූ සෑම ආණ්ඩුවක් ම මුහුණු පෑ පොදු ගැටළුවක් විය. මෙහි දී ආණ්ඩුවට කිසියම් තෝරා ගැනීමක් කිරීමට සිදු විය. එනම්, රට තුළ බහුතර ජනතාවක් "පාරිභෝගිකයන්" ලෙස නියෝජනය වන බැවින්, ඔවුන්ගේ අවශ්‍යතාවය මුදුන්පත් වන අයුරින් "ආහාර ආනයනය" කර, ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කර, රජයේ දේශපාලන ස්ථාවරත්වය ලබා ගන්නේ ද, නැතහොත් ආහාර ස්වයංපෝෂිතභාවය වර්ධනය කිරීම සඳහා දේශීය සුළුතර කුඩා ගොවි නිෂ්පාදන කණ්ඩායම් ආරක්ෂා කරමින් "ආහාර ආනයනය" නතර කර, ගොවි ආදායම් ඉහළ නංවා, ඔවුන් ආරක්ෂා කරන්නේ ද යන්නත්, එමගින් "දේශපාලනමය අස්ථාවරත්වය" කරා ළඟා වන්නේ ද යන්නත් නිදහසින් පසු ව ආණ්ඩුවල බිඳවැටීම් වලට මෙන් ම නව ආණ්ඩුවල පත්වීම්වලට ද මෙය තීරණාත්මක වූ සාධකයක් විය.

දේශපාලන නායකත්වය මෙරට ආහාර නිෂ්පාදනය සහ එහි ස්වයංපෝෂිතභාවය සඳහා ප්‍රබල ලෙස දායක වූ අවස්ථාවන් ද බහුල ය. උදාහරණ ලෙස 1970 දශකයේ අගභාගය තුළ ක්‍රියාත්මක කරන ලද "කඩිනම් මහවැලි ව්‍යාපාරය" මනා දේශපාලන නායකත්වයකින් හා දේශපාලන ස්ථාවරත්වයකින් යුතු පරිසරයක් තුළ ක්‍රියාත්මක කළ මහා සංවර්ධන ව්‍යාපාරයක් විය. එය මෙරට වී නිෂ්පාදනයේ ඇති වූ අති විශාල ප්‍රගතියටත් අතිරේක ආහාර භෝග සංවර්ධනයටත්, පොදුවේ මෙරට ආහාර නිෂ්පාදනයේ වර්ධනයට හා සංවර්ධනයටත් මැනවින් දායක වී ඇත.

නිදහස ලැබීමට පෙර ආරම්භ කරන ලද පොළොන්නරුව "ගල්ඔය ගොවිජනපද ව්‍යාපාරය" 1960 දශකයේ පමණ ආරම්භ කළ "උඩවලව සහ වෙනත් වියළි කලාපීය ගොවිජනපද ව්‍යාපාර" හා "වාරිමාර්ග ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම" මෙහි ලා දායක වූ සාර්ථක කෘෂිකාර්මික සංවර්ධන යෝජනා ක්‍රම ලෙස හඳුන්වා දිය හැකි ය. එසේ ම දුර්වල හා අස්ථාවර දේශපාලන ක්‍රියාවලීන් තුළ තීරණය කරන ලද ඇතැම් ආහාර නිෂ්පාදන වැඩසටහන් අසාර්ථක වී මෙරට ආහාර ස්වයංපෝෂිතභාවය මෙන් ම සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළු හා බාධාවන් ඇති වූ අවස්ථාවන් ද මෙරට ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුළ විරල නො වනු ඇත.

## ආහාර ආනයනය හා ලෝක ආහාර ආධාර

නිදහස ලැබීමට පෙර සිටත්, ඊට පසු වසර ගණනාවක් යන තුරුත් ශ්‍රී ලංකාව ද "සම්ප්‍රදායික ව ආහාර ආනයනය" කරන රටක් ලෙසත්, ලෝක ආහාර ආධාර ලබන්නකු ලෙසත් හඳුන්වා දී තිබිණි. යටත් විජිත සමයේ සිට මෙරට ආහාර ආනයනය ආරම්භ වූ අතර, එය අද දක්වා ම සිදුවන ක්‍රියාවලියකි. කෙසේ වුව ද නිදහසින් පසු මෙරට ආහාර ආනයන ක්‍රියාවලිය තුළ වෙනසක් ඇති වන්නට වුයේ විවිධ ආණ්ඩු විසින් ආරම්භ කරන ලද ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ වැඩසටහන් හේතු කොටගෙනය. පහත සඳහන් සංඛ්‍යා සටහන (වගුව - 4) නිරූපණය කරනුයේ ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියා කලාපීය රටවල් කිහිපයක ආහාර ආනයනය සහ ආධාරවල ප්‍රමාණයන් ය.

ලොව බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාතික රටවල් සියල්ල ද, තවමත් ආහාර අවශ්‍යතාවයන් සපුරා ගන්නේ ආහාර ආනයනයෙන් හා ආධාර මගිනි. එමගින් රටක "ස්වයංපෝෂිතභාවය" හා "සුරක්ෂිතතාවය" පවත්වාගෙන යාමේ දිගුකාලීන මෙන් ම කෙටිකාලීන විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවනු ඇත. 2008 වසර තුළ දී කෙටිකාලීන ව "ලෝක ආහාර මිල ඉහළ යාම" මෙහි ලා පෙන්වා දිය හැකි හොඳ ම උදාහරණ යි. ඒ අනුව විශේෂයෙන් ම ආහාර අතිරික්තයක් නිපදවන රටවල යම් යම් හේතූන් මුල් කරගෙන ආහාර හිඟයක් ඇතිවූ විට, ආහාර ආනයනය මත සිටින රටවලට භයානක ප්‍රතිඵල ගෙනදීමට හේතු වනු ඇත. වර්ෂ 1973/74 සමයේ ඇති වූ ලෝක ආහාර අර්බුදය හමුවේ ආහාර ආයාත මත රැඳී සිටි ශ්‍රී ලංකාව වැනි රටවල් ආහාර හිඟයකට මුහුණ පෑවේ ය. සමහර අප්‍රිකානු රටවල දහස් ගණනක් මිය යාමට ද එය හේතු විය.

වගුව 4

**දකුණු ආසියා රටවල් සඳහා ආහාර ආනයන හා ආහාර ආධාර**

| රට | මුළු වාණිජමය ආනයනවලින් වාණිජමය ආහාර ආනයනය (ප්‍රතිශතවලින්) | | ධාන්‍ය ආනයන ප්‍රමාණය (ටොන් '000 දහස්) | | ආහාර ආධාර (ධාන්‍ය ලෙස) (ටොන් '000 දහස්) | |
|---|---|---|---|---|---|---|
| | 1995 | 2005 | 1995 | 2005 | 1994 | 2004 |
| ඉන්දියාව | 4 | 3 | 110 | 135 | 234 | 50 |
| බංගලාදේශය | 17 | 19 | 4,280 | 3,744 | 857 | 325 |
| නේපාලය | 11 | 17 | 89 | 362 | 11 | 11 |
| පකිස්ථානය | 24 | 11 | 167 | 1,537 | 138 | 8 |
| ශ්‍රී ලංකාව | - | 12 | 1,752 | 1,527 | 340 | 57 |
| මාලදිවයින | 82 | 16 | 66 | 3 | 3 | 8 |

මූලාශ්‍රය : ලෝක බැංකුව සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (ලෝක සංවර්ධන දර්ශක)

ආහාර ආධාර ලබාගැනීම, ශ්‍රී ලංකාව කෙරේ බරපතල ප්‍රශ්නයක් නොවුව ද, "ආහාර ආනයනය" ජාතික වශයෙන් බරපතල ගැටළු මතු කරන්නක් වී ඇත. එමගින්, දේශීය කෘෂිකර්මයේ කඩා වැටීමක් සිදුවන බව ප්‍රායෝගික ව පෙනී ගොස් ඇති අතර, එය ජාතික දේශපාලන ගැටළුවක් බවට පත් වී ඇත. මුලින් විශ්ලේෂණය කළ පරිදි, රජය විසින් හිඟ ආහාර ආනයනය කර, ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කරන්නේ ද, නැතහොත් ආහාර ආනයනය සීමා කර, දේශීය නිෂ්පාදනය වර්ධනය කර, සංවර්ධනය කරන්නේ ද යන ගැටළුවට මුහුණ පෑ යුතු ය. මේ නිසා ආහාර ආනයනය දැඩි විවේචනාත්මක සංසිද්ධියක් බවට පත් වී ඇත.

"ආහාර ආනයනය" අනාගතයේ දී සීමා කර පසු ව සම්පූර්ණයෙන් නතර කරදැමීම සඳහා මෑතක සිට සැලසුම් සම්පාදනය කරමින් තිබේ. ආහාර ද්‍රව්‍ය ලෙස සීනි, තිරිඟු පිටි, කිරි ආහාර ද්‍රව්‍ය, වැනි මූලික ආහාර ආනයන සඳහා විශාල විදේශ විනිමයක් වැය කිරීමට සිදු වී ඇත. මේ අතර දේශීය අවශ්‍යතාවය සඳහා වියළි මිරිස් වැනි භෝග දේශීය ව නිපදවිය හැකි වුව ද ඒවා ආනයනය කිරීමට සිදු වී ඇත්තේ, පසුකාලීන ව මෙරට ක්‍රියාත්මක කළ වෙළෙඳ ප්‍රතිපත්තිවල යම් යම් දුර්වලතාවයන් නිසා ය. මෙයට අමතර ව මෑතකාලීන ව දොඩම්, ඇපල් සහ මිදි වැනි පලතුරු විශාල ලෙස මෙරටට ආනයනය කිරීමට පටන්ගෙන ඇත. මේ නිසා දේශීය කෙසෙල්, දොඩම්, පැපොල් වැනි පලතුරු වර්ග සඳහා වෙළෙඳපොළ සීමා වන අතර, ආනයනික පලතුරු සඳහා වැය කරන විදේශ විනිමය ප්‍රමාණය ඉතා අධික ය. මේ හේතුවෙන් ද මෙරට ආහාර ස්වයංපෝෂිතභාවය හා ආහාර සුරක්ෂිතතාවය සඳහා දැඩි බලපෑම් එල්ල වී ඇත.

### ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනයේ මෑත කාලීන සංවර්ධන ප්‍රවණතාවයන්

ලංකාවේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුළ පොදුවේ සුවිශේෂී සංවර්ධන ප්‍රවණතාවයන් කීපයක් ඇති වුව ද, ඇතැම් ආහාර භෝග ආශ්‍රිත ව එවැනි ගුණාත්මක, ප්‍රමාණාත්මක වර්ධනයක් දැකිය නො හැකිය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවන් අනුව, සකසා ඇති ආහාර නිෂ්පාදන "පරිමා දර්ශකය" පිළිබඳ සටහනක් පහත (වගුව - 5) දැක්වේ. මේ සටහන අනුව 2003 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා ඒ ඒ කෘෂිකාර්මික නිෂ්පාදන අංශයන් හි නිෂ්පාදන වර්ධනය දක්වා ඇත. මෙහි දී 2002 වර්ෂය 100 ලෙස නැතහොත් පදනම් වර්ෂය ලෙස භාවිතා කර ඇත.

පහත වගුව මගින් පසුගිය වසර 5 ක කාලය තුළ මෙරට ආහාර නිෂ්පාදනය පිළිබඳ ව ඒ ඒ ක්ෂේත්‍රයේ ප්‍රගතිය නිරූපනය කර ඇත. 2002 වසර 100 ක් ලෙස සලකා ගත්විට වී නිෂ්පාදනය 2007 වන විට 109.48 කින් ද, එළවළු නිෂ්පාදනය 132.80 කින් ද සත්ව නිෂ්පාදනය 122.60 කින් ද ධාන්‍ය නිෂ්පාදනය 197.27 කින් ද ඉහළ ගොස් ඇත. මේ අනුව ආහාර නිෂ්පාදනය පිළිබඳ මෑතකාලීන ව ලැබූ මෙම ප්‍රගතිය, මෙම ක්ෂේත්‍රයේ සුවිශේෂී සංවර්ධනයක් සිදු වන බවට පෙන්වා දිය හැකි උදාහරණයකි.

වගුව 5

**කෘෂිකාර්මික නිෂ්පාදනය ආශ්‍රිත පරිමා දර්ශකය -2003-2007**

| නිෂ්පාදන ක්ෂේත්‍රය | 2003 | 2004 | 2005 | 2006 | 2007 |
|---|---|---|---|---|---|
| වී නිෂ්පාදනය | 107.31 | 91.88 | 113.50 | 116.85 | 109.48 |
| ධාන්‍ය නිෂ්පාදනය | 116.00 | 130.27 | 157.82 | 174.04 | 197.27 |
| අනෙකුත් ආහාර භෝග | 95.30 | 96.55 | 110.06 | 114.84 | 117.93 |
| එළවළු නිෂ්පාදනය | 99.70 | 113.74 | 120.17 | 120.54 | 132.80 |
| පලතුරු නිෂ්පාදනය | 103.41 | 105.22 | 106.28 | 99.38 | 101.15 |
| සත්ව නිෂ්පාදනය | 111.61 | 114.89 | 116.59 | 120.69 | 122.60 |
| සුළු අපනයන භෝග | 98.93 | 95.39 | 96.49 | 94.71 | 95.34 |
| සමස්ත දර්ශකය | 102.68 | 101.40 | 108.48 | 110.37 | 110.80 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (පදනම් වර්ෂය 2002=100)

ශ්‍රී ලංකාවේ වී සහල් නිෂ්පාදනය මෑතකාලීන ව සුවිශේෂී දියුණුවකට පත් ව ඇත. නිෂ්පාදන ප්‍රමාණයේ

තත්ත්වය, වර්ගය, ගුණාත්මක බව, ඇසුරුම්, අපද්‍රව්‍ය තොර බව ආදී විවිධ අංශයන්ගෙන් මෙම දියුණුව ලබා ඇත. වගු අංක 6 න් දැක්වෙනුයේ පසුගිය දශක 2 කට ආසන්න කාලයක් තුළ මෙරට වී සහල් නිෂ්පාදනයේ ප්‍රගතිය සහ ඒක පුද්ගල ලබා ගැනීමේ හැකියාව වර්ධනය වූ ආකාරය යි.

වී/සහල් නිෂ්පාදනයට අයත් වන අනෙකුත් ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල ද සැලකිය යුතු වර්ධනයක් පසුගිය මෑතකාලීන තත්ත්වය වගු අංක 7 මගින් විස්තර වේ. දේශිය නිෂ්පාදනයන් තුළ විශේෂ වර්ධනයක් සිදු වී නොමැති බවට සාක්ෂි සපයන පහත සඳහන් සටහන, ඒක පුද්ගල ලබා ගැනීමේ හැකියාව පසුගිය වසර කිහිය තුළ සම මට්ටමින් පවත්වාගෙන යාමට හැකි වී ඇති බවද පෙන්වා දෙයි.

රතුළූණු හා ලොකුළූනු, සීනි සහ වියළි කරවල වැනි ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල ඒක පුද්ගල ලබා ගැනීමේ

වගුව 6

**වී/සහල් නිෂ්පාදනය, ආනයන ප්‍රමාණය හා ඒක පුද්ගල ලබා ගැනීමේ හැකියාව, 2000 -2007**

| වර්ෂය | දේශිය වී නිෂ්පාදනය (ටොන් '000) | වෙනත් කටයුතු සඳහා වෙන් කිරීම් | | දේශිය සහල් නිෂ්පාදනය (ටොන් '000) | ආනයනය කරන ලද සහල් ප්‍රමාණය (ටොන් '000) | අපනයනය කරන ලද සහල් ප්‍රමාණය (ටොන් '000) | මිනිස් පරිභෝජනය සඳහා ලබාගත හැකි මුළු ප්‍රමාණය (ටොන් '000) | ඒක පුද්ගල ලබාගැනීමේ හැකියාව) කි.ග්‍රෑ/වර්ෂය) |
|---|---|---|---|---|---|---|---|---|
| | | බීජ අවශ්‍යතාවය (ටොන් '000) | අපතේ යාම් සහ වෙනත් (ටොන් '000) | | | | | |
| 2000 | 2,859.90 | 90.54 | 171.73 | 1,766.39 | 14.85 | 2.01 | 1,767.84 | 95.73 |
| 2001 | 2,695.80 | 82.32 | 171.47 | 1,660.57 | 51.95 | 1.80 | 1,770.70 | 94.53 |
| 2002 | 2,859.48 | 87.91 | 180.63 | 1,761.84 | 95.10 | 2.15 | 1,864.44 | 98.09 |
| 2003 | 3,071.21 | 101.32 | 187.13 | 1,892.28 | 34.52 | 2.13 | 1,922.98 | 99.88 |
| 2004 | 2,628.00 | 80.28 | 177.02 | 1,612.08 | 221.61 | 2.38 | 1,830.90 | 94.08 |
| 2005 | 3,246.19 | 96.64 | 198.98 | 2,006.39 | 51.72 | 4.07 | 2,053.42 | 104.40 |
| 2006 | 3,342.00 | 93.89 | 201.19 | 2,071.91 | 11.54 | 3.90 | 2,079.54 | 104.57 |
| 2007 | 3,131.08 | 84.22 | 195.36 | 1,939.02 | 88.00 | 3.00 | 2,023.68 | 101.13 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ආහාර ශේෂ පත්‍රය, 2007

වසර කිහිපය තුළ සිදු වී ඇත. මාශ භෝග ලෙස සැලකෙන මුං ඇට, කව්පි, සෝයා බෝංචි වැනි ආහාර ද්‍රව්‍යවල දේශිය නිෂ්පාදනය, සහ ආනයන ප්‍රමාණයන්ගේ හැකියාව සහ අර්තාපල් සඳහා වූ දේශිය නිෂ්පාදන සහ ආනයන ප්‍රමාණයන් හා ඒක පුද්ගල ලබා ගැනීමේ හැකියාව පහත සඳහන් සංඛ්‍යා සටහන් ද්විත්වයෙන් නිරූපණය කෙරේ. (වගුව 8/9). මෙම සෑම ආහාර

වගුව 7

**ශ්‍රී ලංකාවේ මාශ භෝග නිෂ්පාදනය, ආයතනය සහ ඒක පුද්ගල ලබා ගැනීම් හැකියාව 2000-2006**

| වර්ෂය | දේශිය නිෂ්පාදනය (මෙ.ටො.) | | | | | ආනයන ප්‍රමාණය | | මුළු සැපයුම (මෙ.ටො.) | ඒකපුද්ගල ලබාගැනීමේ හැකියාව (කි.ග්‍රෑ./ වර්ෂය) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මුංඇට | කව්පි | සෝයා බෝංචි | මුංඇට සැපයුම | මුළු සැපයුම් ප්‍රතිශතයක් ලෙස (%) | මුළු ආනයනය, ප්‍රමාණය (මෙ.ටො.) | මුළු සැපයුම් ප්‍රතිශතයක් ලෙස (%) | | |
| 2000 | 11,690 | 12,120 | 640 | 24,450 | 21.34 | 90.110 | 78.66 | 114,560 | 6.02 |
| 2001 | 9,720 | 9,840 | 620 | 20,180 | 16.40 | 102,840 | 83.60 | 123,020 | 6.34 |
| 2002 | 1,0320 | 10,440 | 1,160 | 21,920 | 15.74 | 117,300 | 84.26 | 139,220 | 6.88 |
| 2003 | 1,0610 | 12,900 | 2,960 | 26,470 | 20.83 | 100,590 | 79.17 | 127,060 | 6.36 |
| 2004 | 7,810 | 9,160 | 1,890 | 18,860 | 15.35 | 103,970 | 84.65 | 122,830 | 6.10 |
| 2005 | 9,000 | 11,180 | 4,990 | 25,170 | 20.57 | 97,170 | 79.43 | 122,340 | 6.00 |
| 2006 | 7,980 | 10,130 | 5,180 | 23,290 | 16.31 | 119,520 | 83.69 | 142,810 | 6.93 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ආහාර ශේෂ පත්‍රය

ද්‍රව්‍යක ම, ඒක පුද්ගල ලබා ගැනීමේ හැකියාව ස්ථාවර ව පවත්වාගෙන යාමට සමත් වී ඇති අතර, දේශීය නිෂ්පාදන ප්‍රමාණයන්ගේ යම් යම් වෙනස්වීම් දක්නට ඇත. දේශීය නිෂ්පාදනයේ විශේෂ වර්ධනයක් මෙම ක්ෂේත්‍ර තුළ ඇතැම් විට දක්නට නො වුව ද, ආහාර සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මෙම ආහාර ද්‍රව්‍ය ඉහළ මට්ටමක පවතින බව මේ අනුව පෙන්වා දිය හැකි ය.

ආහාර නිෂ්පාදන ක්‍රියාවලියෙ හි මෑතකාලීන ව සිදු වූ වෙනත් සුවිශේෂ සිද්ධි කීපයක් මෙහි ලා හඳුනා බඳුන් විය. මේ අතර, අනෙක් විශේෂ සිද්ධිය වූයේ ගොවිපළ ආදායම් නැතහොත් වී අලෙවි කිරීමෙන් ගොවීන්ගේ ආදායම් ඉහළ යෑම යි. වී කිලෝවක් සඳහා රුපියල් 35-40 දක්වා ඉහළ මිලක් ලැබීමෙන් වී ගොවීන්ගේ ආදායම් මට්ටම විශාල ලෙස වර්ධනය වූ අතර, එය මෙරට වී ගොවීන් එතෙක් ඉතිහාසය තුළ ලැබූ ඉහළ ම මිල ගණන් විය. එය ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ යාම කෙරේ සෑහෙන දුරට හේතු වී ඇත.

එළවළු මිල ගණන් මෙන් ම පලතුරු සහ අනෙකුත් ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන්වල වැඩි වීම

වගුව 8

**ශ්‍රී ලංකාවේ අර්තාපල් නිෂ්පාදනය, ආනයන ප්‍රමාණය හා ඒක පුද්ගල ලබා ගැනීමේ හැකියාව**

| වර්ෂය | දේශීය නිෂ්පාදන ප්‍රමාණය | | ආනයන ප්‍රමාණය | | මුළු සැපයුම (ටොන්) | ඒක පුද්ගල ලබාගැනීමේ හැකියාව (කි.ග්‍රෑ./වර්ෂය) |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (ටොන්) | ප්‍රමාණය මුළු සැපයුමේ ප්‍රතිශතයක් | ප්‍රමාණය (ටොන්) | ප්‍රමාණය මුළු සැපයුමේ ප්‍රතිශතයක් | | |
| 2000 | 48410 | 29.38 | 116,450 | 70.67 | 164,770 | 7.63 |
| 2001 | 57680 | 47.94 | 62,560 | 52.00 | 120,310 | 5.32 |
| 2002 | 88710 | 70.02 | 38,000 | 29.99 | 126,700 | 5.30 |
| 2003 | 71750 | 13.93 | 40,490 | 36.07 | 112,240 | 4.56 |
| 2004 | 81270 | 74.37 | 28,010 | 25.63 | 109,280 | 4.49 |
| 2005 | 79450 | 66.10 | 40,750 | 33.90 | 120,200 | 5.12 |
| 2006 | 78490 | 62.77 | 46,550 | 37.23 | 125,040 | 5.12 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ආහාර ශේෂ පත්‍රය

ගත හැකි ය. විශේෂයෙන් ම 2008 වසරේ සිට මෙරට "ආහාර ද්‍රව්‍යවල මිල" විශාල ලෙස වැඩි විය. විශේෂයෙන් ම "සහල් හා වී මිල" සෑහෙන ප්‍රමාණයකින් ඉහළ ගිය අතර පරිභෝජන මිල ගණන් දැඩි ලෙස සාකච්ඡාවට ද පසුගිය වසර කීපය තුළ පෙන්නුම් කළ අතර එය ලෝක ආහාර අර්බුදයේ ප්‍රතිඵල හා සමගාමී විය. ආනයනික ආහාරවල සේ ම දේශීය ආහාර නිෂ්පාදන මිල ගණන් ද ඉහළ යාමක් පෙන්නුම් කෙරිණි. කෙසේ

වගුව 9

**සීනි, ලොකුළූණු, රතුළූණු සහ වියළි කරවල සඳහා පුද්ගල ලබා ගැනීමේ හැකියාව, 2000-2006**

| වර්ෂය | ඒක පුද්ගල ලබාගැනීමේ හැකියාව | | |
|---|---|---|---|
| | සීනි (කි.ග්‍රෑ./වර්ෂයකට) | ලොකුළූණු හා රතුළූණු (කි.ග්‍රෑ./වර්ෂයකට) | වියළි කරවල (කි.ග්‍රෑ./වර්ෂයකට) |
| 2000 | 31.28 | 6.76 | 4.32 |
| 2001 | 30.69 | 5.88 | 3.84 |
| 2002 | 31.35 | 6.54 | 3.98 |
| 2003 | 28.52 | 6.47 | 3.81 |
| 2004 | 27.67 | 6.28 | 3.54 |
| 2005 | 24.17 | 7.20 | 2.96 |
| 2006 | 27.71 | 8.08 | 4.23 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ආහාර ශේෂ පත්‍රය

වුව ද, රට තුළ පවත්නා ඉහළ ස්වභාවික කෘෂි නිෂ්පාදන හැකියාව සහ ධාරිතාවයත්, ආණ්ඩුව විසින් හඳුන්වා දෙන ලද පොහොර සහනාධාර වැඩපිළිවෙළ වැනි ප්‍රතිපත්තිමය වැඩසටහන් හා සැලසුම් මගින් ද දේශීය ආහාර අර්බුදය තවදුරටත් වර්ධනය කිරීමේ වේගය පාලනය කර ඇත. ඒ නිසා ලෝක ආහාර අර්බුදය බොහෝ සංවර්ධනය වූ රටවලටත්, සංවර්ධනය වෙමින් පවත්නා රටවලටත් වඩා අඩුවෙන් ශ්‍රී ලංකාව කෙරේ බලපෑ බව මෙහි ලා පෙන්වා දිය හැකි ය. වෙනත් අර්ථයකින් ගතහොත් "ලෝක ආහාර අර්බුදය" යන්න ලොව වෙනත් රටවලට බලපාන සංසිද්ධියක් මිස, ශ්‍රී ලංකාව කෙරේ දැඩි බලපෑම් සිදු කළ සංසිද්ධියක් නො වන බව ය. ඒ අනුව, ආහාර මිල ඉහළ ගොස් තිබුණේ සත්‍ය වශයෙන් ම මෙරට ඇති වූ "ආහාර හිඟයක්" නිසා නොව ලෝක වෙළෙඳපොළ තුළ සිදු වූ ඉන්ධන මිල ඉහළ යාම, විනිමය අනුපාතිකයේ උච්චාවචනයන් හා වෙනත් ජාත්‍යන්තර වෙළෙඳපොළ මූලික කරගත් හේතූන් මුල්කරගෙන ය.

## ආහාර අර්බුදය සඳහා ශ්‍රී ලංකාවේ විසඳුම්

***"ශ්‍රී ලංකාවේ පවතින වර්තමාන ආර්ථික රටාව අනුව ආහාර ද්‍රව්‍ය ආනයනයට අතිවිශාල මුදලක් වැය කිරීම ඉතා අපහසු ය. එමෙන් ම ආනයනය කරන බොහොමයක් ආහාර ද්‍රව්‍ය දේශීය වශයෙන් නිපදවා ගැනීමට ඇති හැකියාව ද අතිවිශාල ය."***

***"ලෝකයේ සෙසු රටවල ආහාර සහ කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදනවලට ඇති ඉල්ලුම ඉහළ යන හෙයින්. මෙරටට එම ද්‍රව්‍ය ආනයනය කිරීමට ඇති හැකියාව ද සීමා වෙමින් පවතී."***

(පිටු අංක 1 "අපි වවමු-රට නගමු" දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම, 2007-2010 කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය)

ඉහත සඳහන් ප්‍රකාශනයෙන් පැහැදිලි වන මූලික කරුණ වන්නේ, ඉදිරියේ දි ඇති විය හැකි ආහාර අර්බුදය පිළිබඳ ව මෙරට බලධාරීන් විසින් ලබාගෙන තිබූ දැනුවත්භාවය යි. වර්තමාන අර්බුදය ලෝක ව්‍යාප්ත ආහාර අර්බුදයක් ලෙස ප්‍රකාශ වන්නේ 2008 වසරේ ය. එසේ වුව ද, මෙරට ආහාර අවශ්‍යතාවයන් අප විසින් ම උපයා ගත යුතු බව සහ ආහාර ආනයනය කිරීමට ඇති සීමාවන් පිළිබඳ මෙරට ජනතාව දැනුවත් කරමින් ආහාර අර්බුදයට නිශ්චිත විසඳුම් සෙවීමේ ක්‍රියාමාර්ගයන්ට, ශ්‍රී ලංකා ආණ්ඩුව එළැඹියේ 2007 වර්ෂයේ දී "අපි වවමු රට නගමු" වැඩසටහන හඳුන්වා දීමෙන්ය. මේ මගින්, කෘෂි නිෂ්පාදනය වැඩි කර, මෙරට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමට ආණ්ඩුව උත්සාහ කරන අතර, එමගින් ශ්‍රී ලංකාවේ ආහාර ස්වයං-පෝෂිතභාවයත්, සුරක්ෂිතතාවයත් වර්ධනය කිරීමට සැලැසුම් කර ඇත. මේ අනුව "අපි වවමු-රට නගමු" දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010 ක්‍රියාත්මක කරමින් පණිවිඩයක් නිකුත් කරන ශ්‍රී ලංකා ජනාධිපතිවරයා, මෙසේ සඳහන් කර ඇත.

***"වගා කළ හැකි සෑම බිම් අඟලක් ම වගා කිරීමේ අපගේ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය ඉලක්ක කරගනිමින්, "අපි වවමු-රට නගමු" තේමාව යටතේ, දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කිරීමට ලැබීම රටට විශාල ජයග්‍රහණයක් බව මම විශ්වාස කරමි."***

***....... රටේ තිරසාර සංවර්ධනය තහවුරු කළ හැක්කේ දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ දැමීමෙන් පමණි. ඒ සඳහා දේශීය නිෂ්පාදකයා සවිමත් කිරීමටත්, ඔවුනට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීමටත් රජය මේ වන විට විශාල පියවරක් ඉදිරියට තබා ඇති බව සතුටින් ප්‍රකාශ කරමි.***

***........ විදේශීය වෙළෙඳපොළ මගින් අපේ දේශපාලනය හා ක්‍රියාදාමයන් තීරණය කරන තත්ත්වයේ සිට, අපි අප ගැන තීරණය ගැනීමට පරිවර්තනය වීමට නම්, මෙබඳු සංග්‍රාමයක් අවශ්‍ය ය........ අද ආරම්භ කරන දැවැන්ත වගා සංග්‍රාමය අතීතයේ පැවති ස්වයංපෝෂිත ආර්ථිකය කරා යාමට පිටිවහලක් සපයනු ඇත.***

අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය,
"අපි වවමු – රට නගමු"
දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම. 2007-2010
(පිටු i සහ ii 2007 අගෝස්තු 21 දින)


**ආචාර්ය ටී.ඒ. ධර්මරත්න**
අංශ ප්‍රධාන -
අලෙවි,ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.